www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපදය හා චීනය අතර ආතතීන් වෙළඳ යුද්ධය අවුලුවාලීමට තර්ජනය කරයි

## US-China tensions threaten to ignite trade war

2010 මාර්තු 18

චීනයට එරෙහිව පසුගිය සතිය තුල සැලකිය යුතු පරිදි තීව්‍ර කෙරුනු එක්සත් ජනපදයේ තර්ජන හා ප්‍රකෝප කිරීම්, සැප්තැම්බරයේ පටන් ඔබාමා පාලනාධිකාරයේ පිලිවෙත බවට පත්ව තිබේ. චීන ටයර් ආනයනවලට එරෙහිව දඬුවම් තීරු බදු පනවන නියෝගයකට ධවල මන්දිරය අත්සන් තැබුවේ සැප්තැම්බර් මාසයේදී ය. පසුව දෙසැම්බරයේ චීන වානේ පයිප්ප නිෂ්පාදනවලට තීරු බදු පනවනු ලැබිනි.

පොලවේ සිට ගුවනට විදින පේට්‍රියට්-3 මිසයිල ඇතුලු ඩොලර් බිලියන 6.4 ක අවි ආයුධ තායිවානයට විකුනූ බව පෙබරවාරි මස මුල දී එක්සත් ජනපදය නිවේදනය කලේ ය. කලින් පැනවුනු තීරු බදුවලට චීනය ප්‍රතිචාර දැක්වූයේ එක්සත් ජනපද කුකුලු මස් ආනයනවලට තීරු බදු පැනවීමෙන් හා මෝටර් රථ අමතර කොටස් ආනයනවලට තීරු බදු පැනවීමට තර්ජනය කිරීමෙනි. ඒ අතර ම චීනය, එක්සත් ජනපදයේ අවි අලෙවි කරන බෝයිං ඇතුලු සමාගම්වලට එරෙහිව සම්බාධක පැනවීම ගැන සලකා බලමින් සිටින බව නිවේදනය කලේ ය.

පෙබරවාරි මාසයේදී ඔබාමා වොෂින්ටන්හි දී, ටිබෙට් භික්ෂු නායක දලයි ලාමා හමු විය. එවැනි හමුවක් ප්‍රකෝප කිරීමක් හැටියට සලකන බවට බීජිනය කල් තබා කල අනතුරු ඇඟවීම් මේ මගින් අවඥා සහගතව පසෙකට දැමුනි.

මෙම ක්‍රියාවන් පසුපස ගැටුම් මාලාවක් පවතියි. ඒ අතර, ඉරානයට එරෙහිව අලුතින් සම්බාධක පැනවීමට චීනය දක්වන විරුද්ධත්වය, ඇෆ්ඝනිස්ථානය සහ පකිස්ථානය තුල වොෂින්ටනයේ මිලිටරි මෙහෙයුම් ඉහල යාම ගැන චීනය වඩවඩාත් කනස්සල්ලට පත්ව සිටීම හා චීන ව්‍යවහාර මුදල වන යුආන් නැතහොත් රෙන්මින්බි යලි අගය කල යුතු බවට එක්සත් ජනපදය කරන බලපෑමට බෙයිජිනය දක්වන ප්‍රතිරෝධයයි.

චීනයට එරෙහි වෙළඳ යුද්ධය උදෙසා එක්සත් ජනපදය තුල සිදු වන උද්ඝෝෂනයේ කේන්ද්‍රය බවට පත්ව ඇත්තේ යුආන් මුදලේ අගය ඉහල දැමීම පිලිබඳ කාරනය යි. යුද්ධය දෙසට කෙරෙන තල්ලුවට නායකත්වය දෙන්නේ ලිබරල්වාදී ඩිමොක්‍රැටික් පක්ෂ සංස්ථාපිතය යි. එහිදී වඩාත් ම කැපී පෙනෙන්නේ *නිව් යෝක් ටයිම්ස්* පුවත්පත යි.

ලිබරල් ආර්ථශාස්ත්‍රඥයෙකු හා *ටයිම්ස්* පුවත්පතේ තීරු ලිපි රචකයෙකු වන පෝල් කෲග්මාන්, චීනයේ පිලිවෙත ආරක්ෂනවාදී යයි හෙලා දකිමින්, "චීනය සමග තරගය" නමින් 15 දින ලිපියක් පල කලේ, චීන අගමැති වෙන් ජියාබාඕ එරට ව්‍යවහාර මුදල යලි තක්සේරු කල යුතු බවට එක්සත් ජනපදය නිකුත් කල අවසන් නිවේදන ප්‍රතික්ෂේප කර දිනක් ගත වුනු තැන ය. කෲග්මාන් මෙසේ ලිවී ය: "චීනයේ ආර්ථික පිලිවෙත සම්බන්ධයෙන් ආතතීන් මතුවෙමින් තිබේ. එය සාධාරන ය. රෙන්මින්බි යන ව්‍යවහාර මුදල අඩු අගයකින් පවත්වා ගැනීමේ චීන පිලිවෙත ගෝලීය ආර්ථික පුනර්ජීවනයට සැලකිය යුතු බාධකයක් බවට පත් වී ඇත. යමක් කල යුතු ය."

කෲග්මාන් කියන පරිදි, කල යුත්තේ, අප්‍රේල් 15 දා භාන්ඩාගාර දෙපාර්තමේන්තුව ව්‍යවහාර මුදල් පිලිබඳව කොන්ග්‍රසයට සිය අර්ධ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරන විට, චීනය තම මුදල අව පරිහරනය කරන්නේ යයි ප්‍රකාශයට පත් කර, එක්සත් ජනපදයට අපනයනය කරන සියලු චීන භාන්ඩවලට සියයට 25ක බදු අධිකාරයක් පැනවීමේ නියෝගයක් නිකුත් කිරීම යි.

ව්‍යවහාර මුදල අවභාවිතා කිරීම සම්බන්ධයෙන් චීනයට නිල වශයෙන් දඬුවම් පමුනුවන ලෙස ද එක්සත් ජනපද කාර්මික නිෂ්පාදකයන් ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිතෝලන තීරු බදු පනවන ලෙස ද ඉල්ලා සිටිමින් භාන්ඩාගාර ලේකම් තිමොති ගෙයිත්නර් සහ වානිජ ලේකම් ගැරී ලොක් වෙත නියෝජිත මන්ත්‍රී මන්ඩලයේ සාමාජිකයන් 130 දෙනෙක් ද සඳුදා ලිපියක් යැවූහ. ඔහියෝහි ඩිමොක්‍රැටිකයෙකු වන ටිම් රයන් මෙසේ පැවසී ය: "චීනයේ එම පිලිවෙත නිසා ඇමරිකානුවන් බොහෝ දෙනෙකුට රැකියා අහිමි වෙනවා."

ඊලග දා, නිව් යෝක්හි චාල්ස් ෂූමර්, මිචිගන්හි ඩෙබී ස්ටැබිනොව් සහ ඔහියෝවේ ෂෙරොඩ් බ්‍රවුන් යන ඩිමොක්‍රැටිකයන්ගේ නායකත්වයෙන් යුතු සෙනෙට් සභිකයන් පස් දෙනෙක්, චීනයට එරෙහිව එක්සත් ජනපදය තීරු බදු සහ වෙනත් දඬුවම් පැමිනවිය යුතු යයි කියා සිටින පනතක් ඉදිරිපත් කලේ ය.

බදාදා දිනයේ දී, සිය රටට වාසිදායක වන පරිදි චීනය තම මුදල අවභාවිතා කිරීම ගැන චෝදනා කරමින් හා බීජිනයේ පිලිවෙතට ප්‍රතිචාර දැක්වීමේ දී එක්සත් ජනපදයෙන් පිටස්තර ලෝකය "නැසූකන්ව සිටීම" ගැන සංවේගය පල කරමින් *නිව් යෝක් ටයිම්ස්* පුවත්පත කතුවැකියක් පල කලේ ය. සිය ව්‍යවහාර මුදල යලි තක්සේරු කරන ලෙස චීනයට එලිපිට ම බලකිරීමෙහි ලා එක්සත් ජනපදය සමග එක් වන්නැයි *ටයිම්ස්* පුවත්පත ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ද යුරෝපා සංගමයට ද ඉන්දියාවට සහ දකුනු කොරියාවට ද කැඳවුම් කලේ ය.

"මෙය, බහුපාර්ශ්වීය එකඟතාවක කොටසක් ලෙස හා ලෝක මට්ටමකින් සිදු කෙරෙන්නේ නම්, පලි ගැනීම හෝ පලි ගැනීම පිලිබඳ තර්ජනයට පවා වැඩි නීත්‍යනුකූල භාවයක් හිමිවන්නේය"යි පුවත්පත ලිවී ය.

පසු ගිය හතලිස් වසර පුරා එක්සත් ජනපදය තරම් අන් කිසි ම රටක් සිය ජාතික අවශ්‍යතා වෙනුවෙන් සිය ව්‍යවහාර මුදල ඒසා පරිමානයකින් රුදුරු ලෙස යොදා ගෙන නැත. ඒ තතු යටතේ චීනය පමනක් වෙන් කර ගෙන පහර දීමෙන් පෙනී යන්නේ එක්සත් ජනපදයේ කුහකත්වය ගමන්කර ඇති දුරයි. වසර තිස්නවයකට පෙර, සිය යුරෝපා සහ ආසියානු සගයන්ගෙන් කිසිදු අදහස් විමසීමක් නොකර, දෙවන ලෝක යුද්ධය අවසානයෙහි පැවැත්වුනු බ්‍රෙට්න් වුඩ්ස් සම්මේලනයේ දී පිහිටුවා ගැනුනු ජාත්‍යන්තර මූල්‍ය රාමුව අවසන් කරමින් නික්සන් පාලනාධිකාරය ඩොලරයට පැවති රන් පිටුබලය ඉවත් කලේ ඒකපාර්ශ්වීයව ය.

ඒ අතර වාරයේම එක්සත් ජනපදය, සිය රටට අපනයනය කරන සියලු භාන්ඩවලට සියයට 10ක අධිබද්දක් පැනවී ය. එක්සත් ජනපද අපනයනයන් වඩා ලාභදායී තත්ත්වයට පත් වන පරිදි සිය ව්‍යවහාර මුදල් යලි තක්සේරු කිරීමට වොෂින්ටනය එවැනි උපක්‍රම මගින් ජර්මනියට සහ වෙනත් ජාතීන්ට බල කලේ ය.

ඩොලරය "අපගේ ව්‍යවහාර මුදල වනබව සැබෑවක් නමුත් ගැටලුව ඔබගේ ය" යි එවකට එක්සත් ජනපද භාන්ඩාගාර ලේකම්ව සිටි ජෝන් කොනලි යුරෝපා නියෝජිතයන් කන්ඩායමක් හමුවේ පැවසුවේ ය යන්න සුප්‍රකට කරුනකි.

එක්සත් ජනපදයේ උද්ධච්ච සහ ආක්‍රමනශීලී ආකල්පය නොතකාම, එක්සත් ජනපදය හා චීනය අතර වෙලඳ ආතතීන් උග්‍රවීමෙන් පිලිබිඹු කෙරෙන්නේ ලෝක ආර්ථිකය තුල ගැඹුරු වෛෂයික සහ ව්‍යුහාත්මක පැලුම් රේඛා මතුවෙමින් තිබෙන බව යි. *ෆිනෑන්ෂල් ටයිම්ස්* පුවත්පතේ අටුවා රචකයෙකු වන මාර්ටින් වුල්ෆ් බදාදා පල කල තීරුවක දී, අවශේෂ ලෝකය තුල අහස උසට නගින හිඟයන් පවතින කාලයක චීනය සහ ජර්මනිය යන ප්‍රධාන අපනයන රටවල් දෙක වෙලඳ සහ ජංගම ගිනුම් අතිරික්ත ගොඩ ගසා ගැනීමෙන් නිදර්ශනය වන ගෝලීය ආර්ථිකය තුල පවත්නා අතිමහත් විසංතුලනය විමසා බැලීමට යොමු විය.

"මෙම අර්බුදයේ දී විවෘත ගෝලීය ආර්ථිකයට සිය පන නල රැක ගත හැකි වේ දැයි මම මවිතයට පත්ව සිටිමි" යි වුල්ෆ් ලීවේ ය. "මෙම සියලු දේ පසුපසින් පවතින්නේ එක් මූලික නොඑකඟතාවකි. කලින් කල පරිදි ම වැඩ කර ගෙන යන ලෙස අතිරික්තයන් සහිත රටවල් අවධාරනය කරයි. එහෙත් ඒවා, සිය ගනුදෙනුකරුවන් කැඩී ගිය දාට අපනයන අතිරික්තයන් කෙරෙහි තමන් තබා තිබෙන විශ්වාසය තමන්ට ම නරකට හිටින බව පිලිගැනීම ප්‍රතික්ෂේප කරයි. ඇත්තට ම, දැන් සිදු වෙමින් පවතින්නේ ද එය යි," ඔහු තව දුරටත් සඳහන් කලේ ය.

එක්සත් ජනපදය පෙරමුනෙහි සිටින හිඟයන් සහිත රටවලට සිය දැවැන්ත මූල්‍ය හිඟ අඩු කර ගත හැකි වන්නේ ඒවා "සිය දල අපනයනයන්ගේ විශාල හා හදිසි නැගීමක්" අත් කර ගත හොත් පමනකි.

තම වෙලඳ හවුල්කරුවන් මත අතිරේක සැපයුම් පැටවීමට සෑම කෙනෙකු ම දැඩි ලෙස උත්සාහ කරන "අසල්වැසියා හිඟමනට දැමීමේ" සටනක පැටලීමේ අනතුරට ලෝකය මුහුන පා ඇතැයි වුල්ෆ් අනතුරු අඟවයි. "1930 ගනන්වල සිදු වුනු මහා විනාශයේ දී ද විශාල ක්‍රියා කලාපයක් ඉටු කලේ එය යි," ඔහු තව දුරටත් ලිවී ය.

1930 ගනන්වල ගෝලීය බිඳ වැටීම නිර්මානය කලා වූත් දෙවන ලෝක යුද්ධය තුලින් කූලු ගැන්වුනු දරුනු ජාතිකවාදයේ නැගීමට තුඩු දුන්නා වූත් මාරක සහ දුස්සාධ්‍ය ප්‍රතිවිරෝධතා සියල්ල යලි වතාවක් සිය බලය තහවුරු කර ගනිමින් සිටී. එවක් පටන් ආර්ථික ජීවිතයෙහි සිදු වුනු අතිමහත් ගෝලීය ඒකාග්‍ර වීම නිසා මෙම ප්‍රතිවිරෝධතා සංකීර්න, වඩා පුපුරනසුලු හා විනාශකාරී විය හැකි මට්ටමකට පත්වී ඇතුවා පමනකි.

වෙලඳ යුද්ධය, තරගකාරී ව්‍යවහාර මුදල් අවප්‍රමානය, ලෝක වෙලඳ පොල සතුරු වෙලඳ සහ ව්‍යවහාර මූල්‍ය කන්ඩායම්වලට කැඩී යාම, මිලිටරිවාදය සහ යුද්ධය වර්ධනය වීම සහ සෑම රටක ම පාලක ප්‍රභූන් තම තමන්ගේ ම කම්කරු පන්තියට ම්ලේච්ඡ ප්‍රහාර එල්ල කිරීමට හැරී ගැනීම සහ ඒකාධිපති පාලන රූපාකාරයන් අටවා ගැනීම සඳහා ලකලෑස්ති වෙමින් සිටීම මේ සියල්ල ම "ධනවාදයේ මර ලතෝනිය" ලෙස ට්‍රොට්ස්කි හැඳින්වූ දෙය යලි ලඟා වෙමින් තිබෙන බවට නොවරදින සලකුනු ය.

ඒවායේ මූලය වන්නේ ගෝලීය ආර්ථිකය සහ ධනවාදී ජාතික රාජ්‍ය පද්ධතිය අතර පවතින මූලික ප්‍රතිවිරෝධතාව යි. ඓතිහාසිකව යල් පැන ගිය සහ රෝගී වුනු ධනපති ක්‍රමයේ රාමුව තුල මානව වර්ගයාට ගැලවීමේ මඟක් ඇත්තේ නැත.

කම්කරු පන්තිය ප්‍රතිරෝධය පාමින් නව විප්ලවවාදී අරගලවලට පිවිසෙනු ඇත යන්න ද ඊට වඩා නොඅඩු මට්ටමකින් වෛෂයිකව නිර්නය වී ඇත.

හදිසි කර්තව්‍යය වන්නේ මෙම අරගල ජයග්‍රහනය කරා ගෙන යාම සඳහා අවශ්‍ය කරන සමාජවාදී විඥ්ඥානය, ක්‍රියා මාර්ගය සහ මූලෝපාය එම අරගල වෙත සන්නිවේදනය කරන නව විප්ලවවාදී නායකත්වයක් වර්ධනය කිරීම යි.

අප්‍රේල් 17 සහ 18 දිනවල, සමාජවාදී සමානතා පක්ෂය ද එහි තරුන ව්‍යාපාරය වන සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ ද *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* සමඟ එක්ව සමාජ අර්බුදය සහ යුද්ධය පිලිබඳව මිචිගන් ප්‍රාන්තයේ ඈන් ආබර්හි දී හදිසි සම්මේලනයක් පවත්වයි. මෙම සම්මේලනය යුද්ධයට ද රැකියාවලට, ජීවන තත්ත්වයන්ට සහ සමාජ වැඩ සටහන්වලට එල්ල වන ප්‍රහාරයට ද එරෙහිව කම්කරු පන්තිය එකමුතු කිරීම සඳහා වූ නව සමාජවාදී මූලෝපායක් සාකච්ඡා කරනු ඇත.

මේ තත්වයට එරෙහිව සටන් කිරීමේ මගක් සොයමින් සිටින සියලු කම්කරුවන්ගෙන් සහ තරුන ජනයාගෙන් අපි ඉල්ලා සිටින්නේ සම්මේලනයට සහභාගි වන ලෙස යි. වැඩි දුර තොරතුරු සහ ලියාපදිංචි වීම සඳහා මෙම අන්තර්ජාල සම්බන්ධකය භාවිත කරන්න.

බැරී ග්‍රේ

© www.wsws.org